ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිෂ්‍ය භට බලකායේ
ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ගණය සඳහා බඳවා ගැනීම - 2018
(විවෘත බඳවා ගැනීම)

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ගණය පහත තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.07.31 වැනි දිනට හෝ ඊට පෙර ලේකම්, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය, නො. 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ජාතික ශිෂ්‍ය භට බලකායේ ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ගණය සඳහා බඳවා ගැනීම 2018" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

| අනු. අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජලනල කාර්මික | 01 |
| 2. | පෙදරේරු | 01 |
| 3. | වඩු කාර්මික | 01 |
| 4. | මෝටර් රථ කාර්මික | 01 |
| 5. | විදුලි කාර්මික | 01 |

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

02. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :*

ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතයි. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

03. *වැටුප් ප්‍රමාණය :*

**PL-03-2016-රු. 25,790.00-10x270-10x300-10x330-12x350-රු. 38,990.00**
(2016/02/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන **II** අනුව වැටුප් ගෙවනු ලැබේ.)

04. *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

05. *වෘත්තීය සුදුසුකම් :*

අදාළ තනතුරට නියමිත පරිදි තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතාවන්හි (**NVQ**) හතරවන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවක් අත්කරගෙන විධිමත් සහතිකයක් ලබා තිබිය යුතුය.

06. *පළපුරුද්ද :*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පළපුරුද්ද රජයේ පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මගින් සනාථ කළයුතුය.

07. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

08. *වයස් සීමාව :*

අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු. 18ට නොඅඩු, උපරිම අවු. 45ට නොවැඩි විය යුතුය.
රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

09. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
(ii) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

10. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණයකට යොමු කර ඉන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

(i) වෘත්තීය පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්‍රමය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| එක් එක් තනතුරට පැවරෙන කාර්යයන් පිළිබඳ හැකියාව මැන බැලීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි | 100 | 40 |

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන ක්‍රමය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| අතිරේක පළපුරුද්ද | 20 | |
| වෙනත් ක්ෂේත්‍රවල ලබා ඇති ප්‍රවීණතාවයන් | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 60 | |

11.(I) ඉල්ලුම් පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, 1-11 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද, 12 සිට අවසන් වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය, නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුණ හොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත්, වැඩිදුරටත් දන්වමි. ඉල්ලුම් පත මේ සමග ඇති ආදර්ශ ඉල්ලුම් පතට අනුව සැකසිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

**සැලකිය යුතුය** - සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතුය.

(II) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත්‍ර එවිය යුතුය.

12. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක කරන දිනය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන අතර ඇබෑර්තු සියල්ලම හෝ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

සුනිල් සමරවීර,<br>ලේකම්,<br>ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය.

අයදුම් පත්‍රය

| |
|---|
| අංකය :————. |
| (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) |

**ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ජාතික ශිෂ්‍ය භට බලකායේ**
**ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවා ගණය සඳහා බඳවා ගැනීම - 2018**
**(විවෘත බඳවා ගැනීම)**

අයදුම්කරන තනතුරට ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න.

| | | |
|---|---|---|
| 1. | ජලනල කාර්මික | |
| 2. | පෙදරේරු කාර්මික | |

| | | |
|---|---|---|
| 3. | වඩු කාර්මික | |
| 4. | මෝටර් රථ කාර්මික | |

| | | |
|---|---|---|
| 5. | විදුලි කාර්මික | |

01. මුලකුරු සමග නම :————————.
02. මුල අකුරුවලින් හැඳින්වෙන නම් :————————.
03. ස්ථිර ලිපිනය :————————.
04. තාවකාලික ලිපිනය :————————.

05. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

06. හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

07. උපන් දිනය: වර්ෂය :————. දිනය :————. මාසය :————.

08. අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස : වර්ෂය :————. මාසය :————. දිනය :————.

09. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී ————. පුරුෂ :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල :

විභාග අංකය :————. විභාගයට පෙනී සිටි වර්ෂය :————.

| විෂයය | සාමාර්ථය | වර්ෂය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

12. වෘත්තීය සුදුසුකම් :

I. ————.
II. ————.
III. ————.

13. පළපුරුද්ද :

I. ————.
II. ————.
III. ————.

**අයදුම්කරුගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම තොරතුරු අසත්‍ය හෝ වැරදි බව තෝරාගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සෙක් වන බවත්, පත් කිරීමෙන් පසු අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන ........................................ මයා/මිය/මෙනවිය ....../....../....../ දින සිට ...................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ...................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් නිලධාරියකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත්, ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අදාළ ................. නිවේදනය ප්‍රකාරව ඔහු/ඇය මේ සඳහා පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, .................. නිවේදනයෙහි සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.